School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 9

තුන්වන වාරය -සැප්තැම්බර් මස පළමු සතිය

සැකසුම - එච්.ඒ සංජය උදය කුමාර

සති පාසල කාර්ය පත්‍රිකාව

පාඩම හෝ ඒකකය - 6.5.1 එස්.පී.චාර්ල්ස් ශිල්පියාගේ නිර්මාණ අගයමු.

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක්කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.5 : තෝරාගත් දේශීය ශිල්පීන්ගේ කලාකෘති රසාස්වාදය කරයි.

පෙර ඉගෙනුම් අවස්ථා/ ශිෂ්‍යා කළයුතු කාර්යන්

01. එස්.පී.චාර්ල්ස් ශිල්පියාණන් පිළිබඳව සැකසුන ඡායාරූප, වීඩියෝ පට බලන්න. ඒ සඳහා පහත යූ ටියුබ් සබැඳි උදව් කර ගන්න. https://youtu.be/pkqeS76BK6o

02. එස්.පී.චාර්ල්ස් ශිල්පියාණන්, අපේ ජාතික කොඩිය, සෙංකෝලය ගැන ලියවී ඇති පොත්පත් සොයාගෙන කියවන්න.
9 ශ්‍රේණිය චිත්‍ර කලාව-තිලකරත්න දිගන්වල මහතා- (පිටුව 94,95,96,97)
චිත්‍ර කලාව-අ.පො.ස.සා/පෙ - එච්.ඩබ්.කුමාරතුංග මහතා (පිටුව 281,282,283).

03. විකිපීඩියා ලිපි සොයා කියවන්න - https://si.wikipedia.org/wiki/ශ්%E2%80%8Dරී_ලංකාවේ_පාර්ලිමේන්තුව
https://si.wikipedia.org/wiki/ශ්%E2%80%8Dරී_ලංකා_ජාතික_කොඩිය

04. මේ පිළිබඳව ලියවුනු පුවත්පත් ලිපි/ වෙබ් පිටු සොයා කියවන්න
https://www.parliament.lk/si/component/phocagallery/category/5?Itemid=&catid=category

කියවීම් පත්‍රිකාව

එස්. පී. චාර්ල්ස්

- 1916 මාතර වැලිගම උපත ලත් එස්. පී. චාර්ල්ස් කොක්මාදුවේ නානායක්කාර ශිල්පියා යටතේ මූලික ව චිත්‍ර කලාව ප්‍රගුණ කර ඇත.
- පාරම්පරික බෞද්ධ සිතුවම් පිටපත් කිරීම හා එහි උන්නතිය වෙනුවෙන් විශාල මෙහෙවරක් කළ ශිල්පියෙකි.
- එස්. පී. චාර්ල්ස් 1944 දී කොළඹ කාර්මික විදුහලේ චිත්‍ර අංශයේ ජේ.ඩී.ඒ. පෙරේරා යටතේ අධ්‍යාපනය ලැබූවෙකි.
- ශ්‍රී ලංකා රජයේ ජාතික කොඩිය හා පාර්ලිමේන්තුවේ සංකේතය වන සෙංකෝලය යන නිර්මාණ සඳහා ඔහුගෙන් ලද දායකත්වය ඉතා විශිෂ්ඨ වේ.

ජාතික කොඩිය

- වර්තමාන ජාතික කොඩිය වශයෙන් භාවිත කරන තීරු සහිත කොඩිය 1949 නිර්මාණය කරන ලද්දකි.
- ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය හා අභිමානය පිළිබිඹු කරන ලෙස ජාතික සංකේත භාවිත කරමින් කරන ලද නිර්මාණයකි.
- ජාතික කොඩියේ වර්ණ හා සංකේත මගින් පිළිබිඹු කරන අර්ථ නිරූපණය

ජාතික කොඩියේ වර්ණ හා සංකේත මගින් පිළිබිඹු කරන අර්ථ නිරූපණය



සෙංකෝලය

- සෙංකෝලය පාර්ලිමේන්තුව තුළ කතානායකවරයාගේ අධිකාරී බලය සංකේතවත් කරයි.
- එමෙන් ම එය සමස්ථ මන්ත්‍රී මණ්ඩලයේ බලතල පිළිබඳ සංකේතයක් ද වෙයි.
- සෙංකෝලය යන්න බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව 1949 දී මෙරට පාර්ලිමේන්තුවට හඳුන්වා දෙන ලද්දකි.
- මෙම සෙංකෝලයේ සැලසුම නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවනුයේ එස්. පී. චාර්ල්ස් ශූරීන්ට ය.



- 1947 එස්. පී. චාර්ල්ස් විසින් අඳින ලද සැලසුම් අනුව මෙම සෙංකෝලය නිර්මාණය කරන ලද්දේ බ්‍රිතාන්‍ය රාජකීය ආභරණ නිෂ්පාදන සමාගමක් විසිනි.
- සෙංකෝලය සැලසුම් නිර්මාණය කිරීමේ දී දේශීය අනන්‍යතාව මනාව ප්‍රදර්ශනය කරන සාම්ප්‍රදායික සැරසිලි රටා හා ආකෘති භාවිත කර තිබේ.
- සෙංකෝලය දිගින් සෙ.මි 122 ක් වන අතර මෙම නිර්මාණය සඳහා රන් රිදී මැණික් මෙන් ම මිට සාදා ගැනීම සඳහා කළුවර ලී භාවිත කොට ඇති බව දැකිය හැකි ය.
- කළුවර ලීයෙන් තැනූ මිට මධ්‍යයේ බිනර මල හා පලා පෙති රටාවලින් අලංකාර කර ඇත.
- කළුවර මිටට ඉහළින් පොළොන්නරු සම්ප්‍රදාය අනුව රන් හා රිදියෙන් කළ කුළුණු හිසකි.
- එහි මුල මැණික් ඔබ්බවා ඇති මුතු දැල් රටාවකි.
- කුළුණු හිස මත මහනුවර සම්ප්‍රදාය අනුව රිදියෙන් කළ නෙළුම් මල සහිත පේකඩයකි.(එය හිඳගල විහාරයේ පේකඩවල ආභාෂය සහිත වේ.)
- පේකඩයට පසු රිදියෙන් කළ ඝනකයකි. එහි සිව් පස සදාකාලිකත්වය, සාධාරණත්වය, සෞභාග්‍යය සංකේතවත් කරමින් ඉර, හඳ, ධර්ම චක්‍රය හා පුන්කලස ද කැටයම් කර ඇත.
- ඝනකය මත සෙංකෝලයේ ප්‍රධාන කොටස වන රිදයෙන් කළ සෙ. මී. 15ක් විශ්කම්භයෙන් යුතු ගෝලයකි.
- එ මතු පිට කඩුවක් අතින් ගත් සිංහරුවක් අල්ප උන්නත ව නිර්මාණය කර ඇත.
- ගෝලයේ ඉහළ හා පහළ රිදියෙන් හා රනින් කළ පලා පෙති (නෙළුම් පෙති) රටාවකි.
- ඊට ඉහළින් කේතුකාකාර අටැස් පළිගුවකි.
- එය චෛත්‍යයක කොත මුදුනේ ඇති චූඩා මාණික්‍ය හැඩය ගනියි. එය නිර්මලත්වය හා උත්තරීතර බව සංකේතවත් කරයි.
- මෙවැනි ස්වරූපයක් සහිත සෙංකෝලය සිංහල රාජ සභාවේ දී භාවිත කළ යෂ්ඨිය, සෝළු ලීය, ලීලා දණ්ඩය යන නම්වලින් හැඳින් වූ නිර්මාණයට සමාන වේ.

ඡායාරූප මූලාශ්‍ර
https://www.parliament.lk/si/component/phocagallery/category/5?Itemid=&catid=category

ඉගෙනුම් පල :
- එස්.පී. චාර්ල්ස් ශිල්පියාගේ කලා නිර්මාණ නම් කරයි.
- ජාතික කොඩිය හා සෙංකෝලය සඳහා භාවිත කර ඇති සංකේත විස්තර කරයි.
- ජාතික කොඩියෙහි හා සෙංකෝලයෙහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ජාතික කොඩිය හා සෙංකෝලයෙහි කලාත්මක ලක්ෂණ රසවිඳියි.
- එම නිර්මාණ ආරක්ෂා කිරීමේ වැදගත්කම පවසයි.

පසු ඉගෙනුම් අවස්ථා

01. පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

02. අමාරු යෙදුම් හා තේරුම් ගැනීමට අපහසු වචන වැඩිහිටියෙකුගෙන්, ගුරුවරයෙකුගෙන් විමසා හෝ ශබ්ද කෝෂයකින් බලා අවබෝධ කර ගන්න. සෑම වචනයක්ම සැක නැතිව පැහැදිළි කර ගන්න.

03. ශබ්ද නගා කියවන්න, අමතක වන විට නැවත නැවත කියවන්න. මතකයෙන් පාඩම තවත් අයෙකුට පවසන්න, ඔබ කතාවක් කියන විලසින් හෝ කෙනෙකුට කතාන්දරයක් කියන විලසින් කියාදෙන්න.

04. පහත දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න, තවත් ආදර්ශ ප්‍රශ්න පත්‍ර සොයාගෙන පිලිතුරු ලියන්න, පසුගිය අ.පො.ස.(සා/පෙ) ප්‍රශ්න පත්‍රවල ඉහත පාඩමේ කරුණු ගැන අසාඇති අදාළ ප්‍රශ්න සඳහා පිලිතුරු ලියන්න. ගැටළු ඇති තැන් ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

භාහිර ඉගෙනුම් අවස්ථා/සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි දේ.

01. පොත්පත් - 9 ශ්‍රේණිය චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය (පිටුව 53,54,55,56)

02. ඊ පාසල් පාඩම් - ඊ තක්සලාව -

https://e-thaksalawa.moe.gov.lk/web/si/library-section/e-library-content/item/164-2014-06-30-11-57-34.html

ඊ නැණ පියස -https://www.enenapiyasa.lk/lms/course/view.php?id=137

පහත ප්‍රශ්න සඳහා පිලිතුරු සපයන්න.

01. එස්. පි. චාර්ල්ස්ගේ කලා නිර්මාණ දායකත්වය ලද ජාතික කොඩිය ඇඳ එහි විවිධ සංකේතවල අර්ථ ලියා දක්වන්න.

02. සෙංකෝලයේ මූලික හැඩය ඇඳ එහි යොදා ඇති සැරසිලි නම් කරන්න.